# වකුගඩු රෝගය වැළඳීම සඳහා රැකියාවේ බලපෑම පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්(පොළොන්නරුව දිස්ත්‍රික්කය ඇසුරෙන්)

*මල්කි සුලෝචනා හේරත්, නෙළුම් කාන්තිලතා, ප්‍රණීත් අභයසුන්දර
මානව විද්‍යා අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
tomalki92@gmail.com

උතුරු මැද පළාත කේන්ද්‍ර කොට ශ්‍රී ලංකාව පුරා පැතිර පවතින කාලීන අර්බුදයක් බවට වකුගඩු රෝගය පත්ව තිබීම නිසා රටට බත සපයන ගොවි පරපුර රෝගීන් බවට පත් වෙමින් පවතී. තාක්ෂණයේ දියුණුවත් සමඟ අඩු පිරිවැයකින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමටත්, කෘමි උවදුරුවලින් මිදීමටත් රසායනික ද්‍රව්‍ය භාවිත කරයි. මෙම රසායනික පොහොර සහ කෘමිනාශන සමඟ නිතර ගැටෙන්නේ කෘෂිකර්මාන්තයේ නියැලෙන ගොවි ජනතාවයි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ වකුගඩු රෝගය සඳහා රැකියාවේ බලපෑම කෙබඳු ද යන්න පිළිබඳව සොයා බැලීමයි. සෙසු පරමාර්ථ ලෙසට දත්ත දායකයන්ගේ ස්ත්‍රී පුරුෂභාවය හඳුනා ගැනීම හා වකුගඩු රෝගයට ගොදුරුවන්නේ කිනම් වයස් මට්ටමක පසුවන්නන්දැයි හඳුනා ගැනීම සඳහන් කළ හැකිය. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පොළොන්නරුව මහ රෝහලේ වකුගඩු ප්‍රතිකාර ඒකකය පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රය සඳහා තෝරා ගන්නා ලදි. මේ සඳහා වකුගඩු රෝගීන් සියයකින් සමන්විත සසම්භාවී නියැදියක් යොදා ගන්නා ලදි. පර්යේෂණයේ දත්ත රැස් කිරීමේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙසට සම්මුඛ සාකච්ඡා උප ලේඛන ක්‍රමය ද ද්විතීයික මූලාශ්‍රය ලෙසට පර්යේෂණ පත්‍රිකා, පොත්පත්, සඟරා, අන්තර්ජාලය මෙන්ම වාර්ෂික වාර්තා ද භාවිත කරන ලදි. දත්ත විශ්ලේෂණය සඳහා SPSS හා භූගෝලීය තොරතුරු පද්ධතිය යන පරිගණක මෘදුකාංග උපයෝගී කර ගන්නා ලදි. පර්යේෂණ ප්‍රතිඵල අනුව දත්ත දායකයන් අතුරෙන් 62% කෘෂි කර්මාන්තය ජීවනෝපාය කරගත් ගොවි ජනතාව ද, 8% කම්කරු වෘත්තීන්වල නියැලෙමින් කෘෂිකර්මාන්තය ආශ්‍රිත කටයුතුවල ද නිරත වූ පුද්ගලයන් විය. ඉතිරි 30% වෙනත් රැකියාවල (රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ, ස්වයං රැකියා) නිරත වූවන් විය. ඉහත ප්‍රතිඵල අනුව පැහැදිලි වන්නේ කෘෂිකර්මාන්තය මූලික කොටගෙන වකුගඩු රෝගය පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල ව්‍යාප්තව ඇති බවයි. දත්ත දායක පිරිසෙන් 79% පුරුෂයන් වූ අතර, ඉතිරි 21% ස්ත්‍රීන් විය. මින් පැහැදිලි වන්නේ ද වකුගඩු රෝගය පුරුෂයන්ට සෑදීමේ වැඩි ප්‍රවණතාවට හේතුව කෘෂිකාර්මික කටයුතුවල පිරිමි පාර්ශවය වැඩිපුර නිරත වීමයි. තෙවනුව දත්ත දායක පිරිසේ වයස් මට්ටම අධ්‍යයනයට ලක් කළ අතර, වකුගඩු රෝගයට බහුලව ගොදුරුවන වයස් කාණ්ඩය ලෙසට වයස අවුරුදු 56-65 කාණ්ඩය හඳුනාගත හැකි විය. එයට හේතුව විය හැක්කේ ඔවුන් ජීවිතයේ වැඩි කාලයක් කෘෂිරසායනික සමග ගැටීමයි. වයස අවුරුදු 55 ඉහළ කෘෂිකර්මාන්තයේ නියැලෙන පුරුෂ පාර්ශවය පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැඩි වශයෙන් වකුගඩු රෝගයට ගොදුරු වී ඇති බව ඉහත දත්තයන් අනුව නිගමනය කල හැකිය. කෘෂිකාර්මික කටයුතුවල නිරතවන විට ආරක්ෂිත පිළිවෙත් අනුගමනය කිරීම හා රසායනික ද්‍රව්‍ය වෙනුවට කාබනික ද්‍රව්‍ය භාවිතයට යොමු වීම තුලින් මෙම වකුගඩු රෝගයෙන් ආරක්ෂා විය හැකි බව දත්ත දායකයන්ගේ අදහස විය.

**ප්‍රමුඛ පද-** කෘෂිකර්මාන්තය; රැකියාව; වකුගඩු රෝගය